සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# බෞද්ධ ශිෂ්ටාචාරය - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- **අංක 01 සිට 50 තෙක් වූ ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4), (5) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

---

(01) බ්‍රාහ්මණයින් හැඳින්වීමට යොදන ලද තවත් නමකි "ද්විජ" යන්න. එසේ හඳුන්වන ලද්දේ මුලින් මව් කුසින් ද, දෙවන වර

(1) ඊශ්වරයාගෙන් ද උපත ලද හෙයිනි. (2) මහා බ්‍රහ්මයාගෙන් ද උපත ලද හෙයිනි.
(3) උපනයන කර්මයෙන් ද උපත ලැබූ හෙයිනි. (4) ආගමෙන් ද උපත ලැබූ හෙයිනි.
(5) යාගයෙන් ද උපත ලැබූ හෙයිනි. (........)

(02) බ්‍රාහ්මණ ධර්මයේ තවත් විශේෂතම ඉගැන්වීමක් නම් ආගමික සංස්කාර පිළිබඳ සංකල්පයයි. එහිදී පිරිමි දරුවකු සඳහා අධිෂ්ඨාන කොට පුත්‍රයකු ලබා ගැනීම.

(1) ගර්භධාන සංස්කාරයයි. (2) පුංසවන සංස්කාරයයි.
(3) සීමා තෝන්නයන සංස්කාරයයි. (4) ජාතකර්ම සංස්කාරයයි
(5) අන්ත්‍යෝෂ්ටි සංස්කාරයයි. (........)

(03) ඉතා පිරිසිදුව අංග සම්පූර්ණව යාග කළ යුතු අතර යාග කිරීමේදී බ්‍රාහ්මණ පූජකයන් ලවා පවත්වා ගත යුතු බවද ඉගැන්වේ. එහිදී යාගය සඳහා සිටි පූජක කණ්ඩායම් අතර, දෙවියන්ට යාගය පිණිස ආරාධනා කරන පූජකයා.

(1) හෝතෘය (2) උද්ඝාතෘය (3) අධ්වර්යු ය.
(4) යඥකාරකය (5) මන්ත්‍ර ජපකය (........)

(04) චතුරාශ්‍රම ධර්මවලට අනුව "සන්‍යාසී" අවස්ථාව ගත කළ යුත්තේ

(1) බ්‍රාහ්මචාරියකු ලෙසය (2) වේද ග්‍රන්ථ අධ්‍යයන කරමිනි.
(3) ගෘහ ජීවිතයේ පස්කම් සැප විඳිමිනි. (4) වනගතව තපස් දිවියක් ගෙවමිනි.
(5) අනගාරික තවුස් දිවියක් ගෙවමිනි. (........)

(05) බ්‍රාහ්මණ ස්වධර්ම සංකල්ප අනුව වෛශ්‍යයන්ට පැවරුන කාර්යයක් නොවන්නේ

(1) දන් දීම (2) ඉගනීම (3) භාවනාකිරීම
(4) යාග කිරීම (5) වෙළඳාම (........)

(06) බ්‍රාහ්මණ ඉගැන්වීම් අතර ඉතා වැදගත් කොට සළකනු ලබන වර්ණ ධර්ම හෙවත් කුලක්‍රමය බෞද්ධ ඉගැන්වීම් තුළින් දැඩිලෙස විවේචනයට ලක්ව ඇත. කුලක්‍රමය ඇතිවූ ආකාරය පැහැදිලි කරන සූත්‍රය.

(1) අග්ගඤ්ඤ සූත්‍රයයි (2) චක්කවත්ති සීහනාද සූත්‍රයයි
(3) තේවිජ්ජ සූත්‍රයයි (4) ධම්මික සූත්‍රයයි (5) අණන සූත්‍රයයි (........)

(07) ක්‍රි: පූ: 6 වන සියවස වන විට භාරතීය සමාජ සංවිධානයේ ආධිපත්‍යය හිමිකර ගනු ලැබුවේ.

(1) බ්‍රාහ්මණයන් විසිනි. (2) ක්ෂත්‍රියන් විසිනි (3) වෛශ්‍යයන් විසිනි

(4) බහුදේව වාදීන් විසිනි. (5) මහාරාජා වරුන් විසිනි (........)

(08) පරම සැපත උදාකරගත හැකි මාර්ගය ලෙසින් බ්‍රාහ්මණයින් විසින් සලකන ලද්දේ

(1) වේදගීතිකා ගැයීමෙනි (2) වේදය ඉගන ගැනීමෙනි (3) දෙවියන් යැදීමෙනි

(4) යාගහෝම පැවැත්වීමෙනි. (5) දන් දීමෙනි. (........)

(09) බ්‍රාහ්මණ කුල සංකල්පය බෙහෙවින්ම අහිතකර බව පෙන්වා දුන් බුන් වහන්සේ විවිධ සාධක ගෙන හැර පාමින් තර්කානු කූලව කුලක්‍රමය බැහැර කළහ. එහිදී "ජීව විද්‍යාත්මක සාධක" දැක්වෙන සූත්‍රය වන්නේ,

(1) වා සෙට්ඨ සූත්‍රයයි (2) අස්සලායන සූත්‍රයයි (3) අම්බට්ඨ සූත්‍රයයි

(4) මධුර සූත්‍රයයි (5) අග්ගඤ්ඤ සූත්‍රයයි (........)

(10) "යෝන කාම්බෝජ යන ජනපද වල ආර්‍ය අනාර්‍ය යනුවෙන් කුල දෙකක් තිබී ඇති බව විස්තර වෙයි. වරින්වර ආර්‍යයන් අනාර්‍යයන් බවටත්, අනාර්‍යයන් ආර්‍යයන් බවටත් පත් වූ බව දැක්වේ. එමගින් කුල ක්‍රමය ස්ථිර සාර ඉගැන්වීමක් නොවන බව පෙනේ." මින් පැහැදිලි කර ඇත්තේ,

(1) දේශපාලනික සාධකයි (2) ජීවවිද්‍යාත්මක සාධකයි (3) මනෝවිද්‍යාත්මක සාධකයි

(4) ආර්ථික සාධකයි (5) ඓතිහාසික සාධකයි. (........)

(11) බුදුන් වහන්සේගේ ආදර්ශ සම්පන්න චරිතය තුළින් ද බ්‍රාහ්මණයින් ඇගයුම් කළ වර්ණධර්මය බැහැර කළහ. එහිදී අදාළ නොවන කරුණ වන්නේ,

(1) සිව් කුලයෙන්ම සසුන්ගත කිරීම

(2) සපදාන චාරිකා ක්‍රමය

(3) කුලක්‍රමය නොසලකා තනතුරු දීම

(4) ක්ෂත්‍රියන්ට පමණක් උසස් තනතුරු ලබා දීම

(5) සුනීත, සෝපාක වැනි සැඩොල් වංශිකයන් පැවිදි කිරීම (........)

(12) බ්‍රාහ්මණ ඉගැන්වීම් අතර ඉතා වැදගත් ඉගැන්වීම් ක්‍රමයක් වන්නේ ස්වධර්ම සංකල්පයයි. එහෙත් එය බුදු දහමින් ප්‍රතික්ෂේප කෙරේ. එයට හේතු සාධක වන්නේ,

(1) බුදුන් වහන්සේ සර්වඥ හෙයිනි.

(2) කුලභේදය නොසලකා පැවිදි කිරීම.

(3) සුදුස්සාට සුදුසු තැන දීම

(4) රජවරුන් සමග සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලය නිසාය.

(5) මහජනතාවගේ දැඩි ඉල්ලීම නිසාය. (........)

(13) ඇතැම් ස්වධර්ම බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණත්‍රයටම සමානවන නමුදු සමහර ස්වධර්ම අසමාන වේ. ඒ අනුව ඉහත වර්ග තුනටම පොදු ස්වධර්මයක් ලෙස සලකා ඇත්තේ

(1) කෘෂි කර්මාන්තයයි (2) යාගකර්මයයි (3) වෙළඳාමයි

(4) යාග කිරීමයි (5) කාමයෙහි නො ඇලීමයි (........)

The National e-learning Portal for The General Education

(14) ආපදා අවස්ථාවන්හිදී ඒ ඒ වර්ණයන්ට අනුගමනය කළ හැකි ආපද්ධර්ම කොටසක් බ්‍රාහ්මණ ඉගැන්වීමෙහි දක්වා තිබේ. ඒවායින් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන කුල දෙකටම ආපදා අවස්ථාවන් හිදී සිදු කළ හැකි කටයුත්තක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) යාග කරවීමයි. (2) කෘෂි කර්මාන්තයයි (3) කාමයෙහි නොඇලීමයි

(4) ප්‍රජා පාලනයයි (5) ඉගැන්වීමයි. (........)

(15) පශ්චාත් වෛදික යුගයේ දී කාන්තාව පිළිබඳ අකාරුණිකව කටයුතු කළ ආකාරය ප්‍රකට කෙරෙන සාධකයක් වන්නේ,

(1) මාතෘ දෙවඟන පිදීමයි. (2) පාර්වතී දෙවඟන පිදීමයි (3) ශක්ති පූජාවයි

(4) ජගත් මාතා වන්දනාවයි (5) සති පූජාවයි (........)

(16) ෂඩ් ශාස්තෘවරුන් අතරින් අකිරිය වාදියකු වූයේ,

(1) අජිතකේස කම්බල (2) සංජය බෙල්ලට්ඨි පුත්ත

(3) නිගණ්ඨනාත පුත්ත (4) මක්කලි ගෝසාල (5) පූරණ කාශ්‍යප (........)

(17) බුදුන්වහන්සේ අකිරියවාදී දුෂ්ටිවාදය දැඩිව විවේචනයට ලක්කළ අයුරු බෞද්ධ සාහිත්‍යයෙන් හඳුනාගත හැකිය. ඊට එක් හේතුවක් වී ඇත්තේ,

(1) සමාජය තුළ කිරියවාදීන් බහුල නොවන නිසාය

(2) සමාජය තුළ අන්තවාදී ක්‍රියා සිදු නොවන නිසාය

(3) සමාජය තුළ සදාචාරය අර්ථවත් කළ නොහැකි නිසාය

(4) සමාජය තුළ ආත්මවාදීන් බහුල වන නිසාය

(5) සමාජය තුළ ශාස්වත වාදීන් බහුල වන නිසාය (........)

(18) බුද්ධකාලීන භාරතයේ ශ්‍රමණ සම්ප්‍රදායට අයත් සමහරු විවිධ ව්‍රත සමාදන් වූහ. ව්‍රත සමාදානයේදී බුදුන් වහන්සේ පසසා ඇත්තේ,

(1) තමා තවන අනුන් නොතවන ව්‍රත සමාදානයයි.

(2) තමා නොතවන අනුන් තවන ව්‍රත සමාදානයයි.

(3) තමා තවන අනුන්ද තවන ව්‍රත සමාදානයයි.

(4) අනුන් තවා තමා නොතවන ව්‍රත සමාදානයයි.

(5) තමන් නොතවා අනුන් නොතවන වෘත සමාදානයයි. (........)

(19) ගණ තන්ත්‍ර රාජ්‍ය අතරින් ප්‍රබල රාජ්‍යයක්ව පැවතියේ

(1) මල්ල රාජ්‍යයයි (2) කෝසල රාජ්‍යයයි (3) වජ්ජි රාජ්‍යයයි

(4) කාසි රාජ්‍යයයි (5) අවන්ති රාජ්‍යයයි (........)

(20) කෝසල රාජ්‍යයට අයත් නගරයක් වන්නේ,

(1) රජගහ නුවරයි (2) විශාලා මහ නුවරයි (3) කුසිනාරා නුවරයි

(4) සාකේත නුවරයි (5) පැලලුප් නුවරයි (........)

(21) බෞද්ධ භික්ෂු සංස්ථාවේ ශ්‍රමණයන් හඳුන්වන ලද්දේ

(1) ශාක්‍යපුත්‍ර ශ්‍රමණ යනුවෙනි. (2) බාහිතපාපී ශ්‍රමණ යනුවෙනි

(3) අචේලක ශ්‍රමණ යනුවෙනි. (4) මුණ්ඩක ශ්‍රමණ යනුවෙනි.

(5) ඒකසාටක ශ්‍රමණ යනුවෙනි. (........)

(22) බුදුරදුන්ගේ ඇගයීමට අනුව බෞද්ධ පබ්බජ්ජාවේ මූලික පරමාර්ථ විය යුත්තේ.

(1) සමූහයක් ලෙස සමගියෙන් ජීවත්වීමයි. (2) පිණ්ඩපාතයෙන් යැපෙන දෙයකින් යැපීමයි

(3) සියලු සාංසාරික දුකින් මිදීමයි. (4) මරණනින් මතු සුගතිගාමී වීමයි

(5) කිසිවකුට බරක් නොවී පහසුවෙන් ජීවත්වීමයි (........)

(23) බුදුසමයෙහි එන පංච ශීලය මෙන් ජෛන සමයෙහි ද පංච විරමණය ගැන කියවෙයි. "එහි සව් විරමණය " යනුවෙන් දක්වා ඇත්තේ,

(1) ගහකොළ අතු ආදිය කැඩීමෙන් වැළකීමයි. (2) සියලු ආශාවන්ගෙන් තොරවීමයි

(3) බොරුකීමෙන් වැළකීමයි (4) සොරකම් කිරීමෙන් වැළකීමයි

(5) ප්‍රාණඝාතයෙන් වැළකීමයි (........)

(24) බුද්ධ කාලයේ අවන්තිරාජ්‍යයේ පාලකයා වූයේ,

(1) උදේනි රජතුමාය (2) බිම්බිසාර රජතුමාය (3) කොසොල් රජතුමාය

(4) චණ්ඩ වජ්ජෝත රජතුමාය (5) අජාසත් රජතුමාය (........)

(25) කාන්තාව සම්බන්ධයෙන් බුදු දහමට අනුකුල අදහස වන්නේ,

(1) කාන්තාවට නිදහස නොදිය යුතුය (2) කාන්තාව කාමය උපදවන්නියකි

(3) කාන්තාව සතුව ඇත්තේ හැඳිමිටේ නුවණයි (4) කාන්තාව ලෝකය ලස්සන කරවයි

(5) කාන්තාව නිවසට පමණක් සීමා විය යුතුය (........)

(26) දිවැස් ඇති භික්ෂුණීන් අතර අගතැන් පත් වූයේ,

(1) ඛේමා තෙරණියයි (2) සකුලා තෙරණියයි (3) කිසාගෝතමී තෙරණියයි

(4) භද්දකච්චාන තෙරණියයි (5) ප්‍රජාපතී තෙරණියයි (........)

(27) මුල් වෛදික යුගයේ දී කාන්තාව පූර්ණ නිදහසක් හිමිකර ගත්තාය. එකී කාල සීමාවේ කාන්තාව ගතකළ ජීවිතය හා සම්බන්ධ නොවන ප්‍රකාශය වන්නේ,

(1) ස්වාමි පුරුෂයා සමග ආගමික කටයුතු කිරීම.(2) සැමියා මළපසු දිවි පිදීම

(3) අධ්‍යාපනයට ඉඩ ලැබීම (4) මවක ලෙස වැඳුම් පිදුම් කිරීම

(5) ගෘහ පාලනයේ දී ස්වාමියා සමඟ එක්වීම (........)

(28) බ්‍රාහ්මණ වංශිකයෝ තම සමාජ ආර්ථික දේශපාලන ආදී අංශයන්හි බලය තහවුරු කර ගැනීමට විවිධ සංකල්ප ඉදිරිපත් කළහ. එම සංකල්ප ශ්‍රමණ සම්ප්‍රදායෙන් ප්‍රතික්ෂේප විය. එලෙස ප්‍රතික්ෂේපිත අංගයක් නොවන්නේ,

(1) ත්‍රිවේදය අගය කිරීම (2) කුලභේදයට ගරු කිරීම

(3) නිදහස් චින්තනයට ගරු කිරීම (4) ඥාණමාර්ගය ප්‍රතික්ෂේප කිරීම

(5) නව විමුක්ති මාර්ග සොයා නොයෑම (........)

(29) දිනක් බුදුන් වහන්සේ අනඳ තෙරුන් වහන්සේ අමතා "ආනන්ද මේ මගධ කෙත්යායෙහි ඇති විසිතුරු බව බලන්න. මේ කෙතෙහි සැලැස්මට අනුව භික්ෂු භික්ෂුණීන්ගේ සිවුර පිළියෙලකරවන්න." මෙම ප්‍රකාශයට අනුව වඩාත් ගැලපෙන පිළතුර වන්නේ,

(1) කෘෂිකර්මාන්තය අගය කළබවයි (2) මගධ රාජ්‍යයේ විසිතුරු බවයි.

(3) සිව්වනක් පිරිස හැඩ ගැස්විය යුතු බවයි (4) වී ගොවිතැන පැවති බවයි

(5) චීවරයේ ගුණාත්මක බව අගය කළ බවයි (........)

(30) බ්‍රාහ්මණ ආගමිකයන් විසින් ඉදිරිපත් කරන ලද ඊශ්වර නිර්මාණ ඉගැන්වීම් බැහැර කරන ඉගැන්වීමක් වන්නේ,

(1) චතුරාර්ය සත්‍යය යි. (2) හේතුඵල ඉගැන්වීමයි.

(3) කුසලාකුසල කර්මයි. (4) පුනර්භවය යි. (5) ත්‍රිලක්ෂණය යි. (........)

(31) සාමඤ්ඤඵල සූත්‍රේ විස්තරවන පරිදි මෙම ශාස්තෘ වරයාගේ මූලික දර්ශනය අමරා වික්ඛෙප වාදයයි. මොහු කිසිදු ප්‍රශ්නයකට ස්ථිර, නිත්‍ය, එකාන්ත පිළතුරක් නොදී ස්‍යාත්වාදී පිළිවෙත අනුගමනය කරයි. මෙම ශාස්තෘවරයා වන්නේ,

(1) පූරණ කාශ්‍යපයි (2) පකුධ කච්චායනයි

(3) නිගණ්ඨනාත පුත්තයි (4) සංජය බෙල්ලට්ඨි පුත්තයි

(5) අජිත කේශ කම්බලයි. (........)

(32) ඉන්දියාවේ විශාලත්වය අනුව මණ්ඩල වශයෙන් කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. ඒවායේ අනුපිළිවෙළ වන්නේ,

(1) මහා මණ්ඩලය, අන්තර් මණ්ඩලය,මධ්‍ය මණ්ඩලය යනුවෙනි.

(2) මධ්‍ය මණ්ඩලය, අන්තර් මණ්ඩලය, මහා මණ්ඩලය යනුවෙනි.

(3) අන්තර් මණ්ඩලය, මහා මණ්ඩලය, මධ්‍ය මණ්ඩලය යනුවෙනි.

(4) මහා මණ්ඩලය, ජනපද මණ්ඩලය, ප්‍රාදේශීය මණ්ඩලය යනුවෙනි.

(5) මහා මණ්ඩලය, මධ්‍ය මණ්ඩලය, අන්තර් මණ්ඩලය යනුවෙනි. (........)

(33) පාලි මූලාශ්‍ර අනුව බුද්ධ කාලීන භාරතයේ පැවති මහා ජන පද ගණනින්,

(1) අටකි. (2) හතකි (3) දහසයකි (4) දොළහකි (5) පහකි (........)

(34) බෞද්ධ ඉතිහාසයේ ප්‍රසිද්ධ වේභාර, වේපුල්ල, ගිජ්ඣකූට, ඉසිගිලි යන පර්වත පිහිටියේ

(1) මගධ රාජ්‍යයේය (2) කෝසල රාජ්‍යයේය

(3) අවන්ති රාජ්‍යයේය (4) වත්ස රාජ්‍යයේය (5) වජ්ජි රාජ්‍යයේය (........)

(35) උදේනි, ගෝතමක, සත්තම්භ,සාරන්දද සහ චාපාල ආදී චෛත්‍යස්ථානවල ද, අම්බපාලී වනයෙහි ද බුදුරදුන් වැඩසිටි බව දැක්වේ. බුදුරදුන් අන්තිම වස්කාලයේ වැඩ සිටි බේලුව ගමද පිහිටියේ මෙහිය. බුදුරදුන් විසින් හඳුන්වා දෙන ලද සප්ත අපරිහානීය ධර්ම අනුව මෙම ජනපදයේ පාලන කටයුතු සිදුවිය. මෙම ජනපදයේ පාලකයන් වූයේ,

(1) මගධ රජදරුවන්ය. (2) අවන්ති රජදරුවන්ය (3) කෝසල රජදරුවන්ය

(4) වජ්ජි රජදරුවන්ය. (5) මල්ල රජදරුවන්ය (........)

(36) නිගණ්ඨනාත පුත්ත ශාස්තෘවරයා කළුරිය කරන ලද්දේ පාවා නගරයේදිය. මෙහි චුන්ද කර්මාර පුත්‍රයාට අයත් අඹවනයක් ද තිබුණි. බුදුන්වහන්සේ එම වනයේද වස් වසා සිටි බව දැක්වෙයි. බුදු සිරිත හා සම්බන්ධතා දක්වන මෙම රාජ්‍යය වන්නේ,

(1) කාසි ජනපදයයි. (2) වජ්ජි ජනපදයයි (3) මල්ල ජනපදයයි

(4) චේතිය රාජ්‍යයයි (5) වත්ස රාජ්‍යයයි. (........)

(37) භාරතීය ආර්ථික ව්‍යුහය පිළිබඳව විමසීමේදී විවිධ ධනෝපායන ක්‍රම තිබුණි. ඉන්ප්‍රධාන ආර්ථික රටාව වූයේ,

(1) වාණිජ්‍යයයි (2) සත්ව පාලනයයි (3) ගෘහස්ථ කර්මාන්තයි

(4) රාජ්‍ය සේවයයි (5) කෘෂි කර්මාන්තයයි (........)

(38) සෑම පුද්ගලයකුම සමාජය කෙරෙහි මහත් වගකීමක් දරන්නෙකි. සමාජ සංකල්පය තුළ ඇතැම් වගකීම් පිළිබඳ පැහැදිලි කෙරෙන බෞද්ධ සූත්‍ර දේශනාවක් වන්නේ,

(1) මහාමංගල සූත්‍රයයි (2) සිගාලෝවාද සූත්‍රයයි (3) අණන සූත්‍රයයි

(4) චක්කවත්ති සීහනාද සූත්‍රයයි (5) ව්‍යග්ගපජ්ජ සූත්‍රයයි (........)

(39) බ්‍රාහ්මණ සංස්කෘතියට එරෙහි වූ ශ්‍රමණ සම්පදා අතර ෂට්ශාස්තෘවරුන් මූලිකවෙයි. එහෙත් ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුගේ අදහස් සමාජ සදාචාරයට හානිකරය. එයට හේතුව අකිරියවාදී අදහස් ඉදිරිපත් කළ නිසාය. ඔවුන් අතරින් කිරියවාදී අදහස් ඉදිරිපත් කළේ,

(1) නිගන්ඨනාත පුත්තයි (2) පූර්ණ කස්සපයි (3) අජිත කේසකම්බිලිය

(4) පකුධ කච්චායනයි (5) සංජය බෙල්ලට්ඨී පුත්තයි. (........)

(40) ෂට්ශාස්තෘන් අතරින් ඉක්මනින්ම පරිහානියට පත් වූයේ " අජිතකේෂකම්බලී" ශාස්තෘවරයාය. එයට හේතු වූයේ ඔහුගේ දසවිධ මිත්‍යා දෘෂ්ටියයි. ඔහු හා සම්බන්ධ ප්‍රකාශය වන්නේ,

(1) සංසාර සුද්ධිවාදය පිළිගැනීමයි. (2) සප්ත පදාර්ථ ඉදිරිපත් කිරීමයි.

(3) කර්ම හා කර්ම විපාක ප්‍රතික්ෂේප කිරීමයි. (4) චාතුයාම සංවරය ඉදිරිපත් කිරීමයි

(5) උච්ඡේදවාදය ප්‍රතික්ෂේප කිරීමයි. (........)

(41) බමුණෝ වර්ණාශ්‍රම ධර්ම මගින් සමාජය තුළ ප්‍රභූත්වය ලදහ. ශ්‍රමණ සම්ප්‍රදායට අයත් පිරිස සමාජයේ විවිධ කොටස්වලින් ඉස්මතු වූවෝ වූහ. මේ නව සමාජ සංවිධාන කෙරෙහි පැහැදුනු බොහෝ බමුණෝ ශ්‍රමණ සම්ප්‍රදායට එකතු වූහ. ඒ අතර ශ්‍රමණ සම්ප්‍රදායට එකතු නොවූ බමුණකු වන්නේ,

(1) සෝණ දණ්ඩ බමුණාය (2) කූට දන්ත බමුණාය

(3) කසී භාරද්වාජ බමුණාය (4) අම්බට්ඨ බමුණාය

(5) තෝදෙය්‍ය බමුණාය (........)

(42) රාෂ්ට්‍ර පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විමසීමේදී දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ විස්තරවන ඓතිහාසික පුරාවෘත්තය අනුව "රජු" යනු

(1) එඩිතර පාලකයෙකි

(2) මහාබ්‍රහ්මයාගේ උරහිසෙන් උපන්නෙකි.

(3) මහජනයා විසින් පත්කර ගන්නා ලද තැනැත්තෙකි

(4) කුලීනයන්ගේ දෙවැනියාය

(5) බමුණන් විසින් පත්කරන ලද තැනැත්තෙකි (........)

(43) අතීතයේ රාජ්‍යවල පිළිවෙත වූයේ රජු මියයාමට ප්‍රථම තම වැඩිමහල් පුතු රාජ්‍යත්වය සඳහා නම්කිරීමය. එවන් පුතකු නොමැති වුවහොත් රජ පවුලේ දක්ෂ විචක්ෂණ පුතකු කැඳවා රාජ්‍යය බාරදෙයි. මෙකී පිළිවෙත ක්‍රියාත්මක වූයේ,

(1) සමූහාණ්ඩු වලය (2) රාජාණ්ඩු වලය (3) මල්ල රජදරුවන් අතරය

(4) සක්විති රාජ්‍යවලය (5) බෞද්ධ රාජ්‍යවලය (........)

(44) බුද්ධ කාලයේත් ඊට පෙරාතුවත් හැම රාජ්‍යයකම වාගේ පැවති දඬුවම් ඉතා නිර්දය විය. "මෝර පබ්බත" වැනි පර්වතයකින් පහතට හෙළීම එයට නිදසුනකි. සූත්‍රවල ද නිර්දය දඬුවම් පිළිබඳ දැක්වෙයි. එම සූත්‍ර වලට අනුව දෙතිස්මහ වධ දුන් බව අඩංගු සූත්‍රය වන්නේ,

(1) සේනාසනක්ඛන්ධ සූත්‍රයයි (2) කූට දන්ත සූත්‍රයයි

(3) රාජෝවාද සූත්‍රයයි (4) චක්කවත්ති සිහනාද සූත්‍රයයි

(5) මහා දුක්ඛක්කන්ධ සූත්‍රයයි (........)

(45) ථේරගාථාවල "මහාපාල" ථේරාපදානයේ වෙළඳුන් සංවිධානය වී සිටිය බව පැවසේ. වෘතීය සමිති ද පැවැති බව පැවසේ. ඒ අතර වාණිජ වෘත්තීය සමිති දහ අටක් සාමූහික ව්‍යාපාර වල නියැලී ඇත. ඒ බව සඳහන් ජාතකකතාවක් වන්නේ,

(1) දරිමුඛ ජාතකයයි. (2) මූගපක්ඛ ජාතකයයි. (3) චන්නූපථ ජාතකයයි.

(4) අපණ්නක ජාතකයයි. (5) සේරිවාණිජ ජාතකයයි. (........)

(46) අග්ගඤ්ඤ සූත්‍රයට අනුව සමාජ ප්‍රභවය සිදුවී ඇත්තේ හේතුඵල න්‍යායට අනුවය. එමෙන්ම රාජ්‍ය සම්භවය ද හේතු ඵල න්‍යායට අනුව සිදුව ඇත. රජ කෙනෙකු තෝරාගැනීමේ දී ද මහජන සම්මතයක් මත සිදුව තිබේ. "රජ" යන නම සැකසී ඇත්තේ,

(1) පවු බැහැර කළ නිසාය (2) කෙත්වලට අධිපති නිසාය

(3) ජනතාව සතුටින් පාලනය කරන නිසාය (4) සැඩ පරුෂ ගති දුරුකළ නිසාය

(5) බ්‍රාහ්මණයන්ට අනුශාසනා කරන නිසාය (........)

(47) "ජන සම්මතවාදී පාලනයක සාම්ප්‍රදායික මූලධර්ම රැකගැනීමෙන් පාලන කටයුතු සිදු කිරීම මගින් එකී පාලන තන්ත්‍රය පහසුවෙන් බිඳ නොවැටෙන්නේය." යනු බුදු සමයේ පිළිගැනීමයි. එවැනි සාරධර්ම පද්ධතියක් ලෙස හැඳින්විය හැක්කේ,

(1) සතර සංග්‍රහ වස්තුවයි. (2) පංචශීල ප්‍රතිපදාවයි

(3) සප්ත අපරිහානීය ධර්මයයි (4) දසරාජ ධර්මයයි

(5) දස සක්විති වත්ය (........)

(48) භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යනු බුදු සමය විසින් පිළිගන්නා පරමාදර්ශී සිවුවනක් පිරිසයි. මෙම පිරිස අතුරෙන් "සාවක සංඝ" නමින් හැඳින්වෙන පිරිසට අයත් ආර්ය ශ්‍රාවකයෝ,

(1) භික්ෂු සංඝයා තුළ පමණක් සිටිති

(2) භික්ෂුණී සංඝයා තුළ පමණක් සිටිති

(3) භික්ෂු භික්ෂුණී උභතෝ සංඝයා තුළ පමණක් සිටිති

(4) උපාසක උපාසිකා දෙපක්ෂය තුළ පමණක් සිටිති

(5) සිව්වනක් පිරිස තුළම සිටිති (........)

(49) සිගාලෝවාද සූත්‍රයෙහි සදිසා නියෝජනය පරිදි විවිධ සමාජ සංස්ථා හඳුන්වා දී තිබේ. දෙමාපිය දූදරු, ගුරු සිසු, අඹු සැමි, මිත්‍ර කුල, ගිහි පැවිදි, සේවක සේවිකා යනු එම සමාජ සංස්ථාය. මේ අනුව දකුණු දිසාවෙන් නියෝජනය වන සමාජ සංස්ථාව වන්නේ,

(1) දෙමාපියෝය (2) ආචාර්යවරුය (3) මිත්‍ර කුල සූත්‍රයෝය

(4) ශ්‍රමණබ්‍රාහ්මණයෝය (5) සේව්‍ය සේවකයෝය (........)

(50) යහපාලනයක් ගෙනයන පාලකයා බෞද්ධ රාජධර්ම වලට අනුව රාජ්‍ය පාලනය කළ යුතුය. බෞද්ධ රාජ ධර්ම අංගයක් ලෙස සතර අගතියෙන් වෙන්වීම දැක්විය හැකිය. අගතිගාමීව කටයුතු කළ කොසොල් රජුට වරක් බුදුන්වහන්සේ උපදෙස් දුන්හ. එම උපදෙස් ඇතුළත් ජාතක කතාව වන්නේ,

(1) ගාමිණී ජාතකයයි (2) ගෝතමක ජාතකයයි (3) රාජෝපාද ජාතකයයි

(4) ගණ්ඩ තීන්දු ජාතකයයි (5) දරිමුඛ ජාතකයයි (........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## බෞද්ධ ශිෂ්ටාචාරය - II

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- I කොටසින් ප්‍රශ්න දෙකක්ද, II කොටසින් ප්‍රශ්න තුනක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

(01) (1) වේද සාහිත්‍ය අනුව ඉන්දීය ඉතිහාසය බෙදෙන යුග හතර නම් කරන්න.

(2) ඍග්වේද යුගයේ ඇදහූ දෙවිවරු හඳුන්වන්න.

(3) ශ්‍රමණ සම්ප්‍රදායේ මූලික මත තුනක් හඳුන්වන්න.

(4) කර්මය පිළිබඳ නිගණ්ඨනාතපුත්තගේ ඉගැන්වීම් සමාලෝචනය කරන්න.

(5) බ්‍රාහ්මණයන් ඉදිරිපත් කළ යාග පහ නම් කරන්න.

(02) (1) ආශ්‍රම ධර්ම නම් කරන්න.

(2) ඉන් දෙකක් හඳුන්වන්න.

(3) මුල් වෛදික සමාජය තුළ කාන්තාවගේ තත්වය කෙබඳු දැයි ගෙන හැර දක්වන්න.

(4) බ්‍රාහ්මණ සංස්කෘතිය තුලින් කාන්තාවගේ සාමාජික නිදහස අහිමි කළ අයුරු සමාලෝචනය කරන්න.

(5) භාරතීය සමාජයේදී කාන්තාව පීඩාවට ලක්ව තිබූ අයුරු පෙන්වා දෙන්න.

(03) (1) දස සක්විතිවත් හඳුන්වන්න.

(2) මනා රාජ්‍ය පාලනයක් සඳහා සතර සංග්‍රහ වස්තුවල උපයෝගීතාව පැහැදිලි කරන්න.

(3) සප්ත අපරිහානීය ධර්ම නම් කරන්න.

(4) දස රාජධර්ම පිළිවෙලින් නම් කරන්න.

(5) සිගාලෝවාද සූත්‍රයට අනුව සේව්‍ය සේවක යුතුකම් හා වගකීම් ගෙනහැර දක්වන්න.

## II කොටස

04. (1) ඊශ්වර නිර්මාණ වාදය යනු කුමක් දැයි පැහැදිලි කොට චතුර් වර්ණයේ දිව්‍යමය ප්‍රභවය පිළිබඳ බ්‍රාහ්මණ මතය ගෙනහැර දක්වන්න.

(2) බ්‍රාහ්මණයින්ගේ වර්ණ ධර්ම අනුව ඒ ඒ වර්ණයට නියමිත වූ කාර්යයන් පැහැදිලි කරන්න.

(3) සමාජ ප්‍රභය පිළිබඳ බ්‍රාහ්මණ මතය බුදු දහමින් ප්‍රතික්ෂේප වූ අයුරු ගෙන හැර දක්වන්න.

(4) ස්ත්‍රීත්වය පිළිබඳ බ්‍රාහ්මණ සමාජයේ පැවති ආකල්පය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

05. (1) පූර්ණ කස්සපගේ අකිරියවාදය පිළිබඳ විවරණයක් කරන්න.

(2) අකිරියවාදී ආගමික අදහස් බුදු දහමින් ප්‍රතික්ෂේපවන ආකාරය පරික්ෂා කරන්න.

(3) නිගණ්ඨනාත පුත්ත තුමාගේ ඉගැන්වීම් සැකෙවින් හඳුන්වා දෙන්න.

(4) ෂට්ශාස්තෲන් අතුරෙන් ඉදිරිපත් වූ භෞතිකවාදී ඉගැන්වීම් මොනවාදැයි පරීක්ෂා කරන්න.

06. (1) බ්‍රාහ්මණ ඒකාධිකාරයට එරෙහිව ශ්‍රමණ සම්ප්‍රදාය ඉදිරිපත් කළ ප්‍රධාන මතවාද ගෙනහැර දක්වන්න.

(2) පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම් කෙටියෙන් පහදන්න.

(3) බුදු සමයෙහි පුද්ගල ස්වාධීනත්වය තහවුරු කොට ඇති අයුරු විස්තර කරන්න.

(4) බුදුන්වහන්සේ සිවුකුලයටම සසුනට පිවිසීමට අවසර දුන්හ. සනාථ කරන්න.

07. (1) සිව්වනක් පිරිස පිළිබඳ ව බුදු රදුන් තුළ පැවති අපේක්ෂාව විස්තර කරන්න.

(2) පෘථග්ජනයා හඳුන්වා ආර්යශ්‍රාවකයාගේ සුවිශේෂත්වය පැහැදිලි කරන්න.

(3) භික්ෂු සංඝ හා ශ්‍රාවක සංඝ ප්‍රභේදය පිළිබඳ කරුණු ගෙන හැර දක්වන්න.

(4) භික්ෂු භික්ෂුණීන්ගේ කාර්යභාරය කුමක් දැයි සමාලෝචනය කරන්න.

08. (1) රාජ්‍යත්වයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ මතය ගෙනහැර දක්වන්න.

(2) සතර සංග්‍රහ වස්තුව හඳුන්වා දෙන්න.

(3) සක්විති රජකු විසින් ක්‍රියාත්මක කළයුතු රාජ්‍යපාලන ප්‍රතිපත්තිය කුමක් දැයි හඳුන්වා දෙන්න.

(4) රටක මනා ආර්ථික සංවර්ධනයක් උදෙසා රාජ්‍ය පාලකයන් විසින් ගත යුතු ක්‍රියාමාර්ග බුද්ධ දේශනා ඇසුරින් විස්තර කරන්න.